(නවවැනි පාර්ලිමේන්තුව - සිව්වැනි සභාවාරය)

අංක 2(10).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන

# න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2023 ඔක්තෝබර් 06 සිකුරාදා**

**2023 ඔක්තෝබර් 17 අඟහරුවාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

ගලහ හදවතී ජාතික භික්ෂු ගිලානෝපස්ථාන මධ්‍යස්ථාන භාරය පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

මාර්ගගත ක්‍රමවල සුරක්ෂිත භාවය පිළිබඳ පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය (අංක 1),— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 අප්‍රේල් 25 දිනැති අංක 2329/19 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නියෝගය (අංක 2),— 2003 අංක 25 දරන මුදල් පනතේ 2(1) වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 25 දිනැති අංක 2342/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නිවේදනය (අංක 1),— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 මැයි 31 දිනැති අංක 2334/24 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— මුදල් පනත යටතේ නිවේදනය (අංක 2),— 2018 අංක 35 දරන මුදල් පනතේ 19 වගන්තිය සමඟ කියවිය යුතු 51 වගන්තිය යටතේ මෝටර් වාහන මත සුඛෝපභෝගී බද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 13 දිනැති අංක 2340/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 1),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 මැයි 31 දිනැති අංක 2334/23 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 2),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 ජූනි 16 දිනැති අංක 2336/69 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යටතේ නියමය (අංක 3),— 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනතේ 3 වගන්තිය යටතේ නිෂ්පාදන බදු සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව 2023 ජූනි 30 දිනැති අංක 2338/58 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 1),— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 32 වගන්තිය සමඟ කියවිය යුතු 2, 12, 22 සහ 25 වගන්ති යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලබන පානීය නොවන ස්ප්‍රීතු සඳහා වූ රීති සංශෝධනය සම්බන්ධයෙන් පනවන ලදුව, 2023 ජූනි 16 දිනැති අංක 2336/70 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 01/2023 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— සුරාබදු ආඥාපනත යටතේ නිවේදනය (අංක 2),— කලින් කලට සංශෝධනය කරන ලද (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 22 වගන්තිය යටතේ මත්පැන් සඳහා වූ සුරාබද්ද සම්බන්ධයෙන් මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජුනි 30 දිනැති අංක 2338/57 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නිවේදනය අනුමත කළ යුතු ය.

(අංක 02/2023 දරන සුරාබදු නිවේදනය)

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත යටතේ නියමය,— 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14(2) වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, වැඩ බලන ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2023 ජූලි 21 දිනැති අංක 2341/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද නියමය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා,— ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි,— 1985 අංක 48 සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4(1) සහ 14 වගන්ති සමඟ කියවිය යුතු 20 වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2023 අගෝස්තු 29 දිනැති අංක 2347/08 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2023.10.03 දින ඉදිරිපත් කරන ලද රෙගුලාසි අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

**2023 ඔක්තෝබර් 19 බ්‍රහස්පතින්දා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

විසර්ජන පනත් කෙටුම්පත — දෙවැනිවර කියවීම.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

---

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2023 ඔක්තෝබර් 20 සිකුරාදා)**

2399/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2016 සිට 2020 දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව්වලට/ජලාශවලට මුදාහරින ලද මිරිදිය මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාව සහ එවායින් ලබා ගන්නා ලද මත්ස්‍ය අස්වැන්න එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වැව්වලට/ජලාශවලට මුදාහරින ලද මත්ස්‍ය පැටවුන් සංඛ්‍යාවට සාපේක්ෂව ලබා ගන්නා ලද මත්ස්‍ය අස්වැන්න සම්බන්ධයෙන් සෑහීමකට පත්වන්නේද;

(iii) කුඩා වැව් ආශ්‍රිතව මිරිදිය මත්ස්‍ය කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2401/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති ඉන්ධන පිරවුම්හල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පිරවුම්හල්වල ලිපිනයන් කවරේද;

(iii) එම පිරවුම්හල් අතරින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සහ ඉන්දියන් ඔයිල් සමාගම සතු පිරවුම්හල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා අනුරාධපුර දිස්ත්‍රික්කය සඳහා ලබා දී ඇති ඉන්ධන පිරවුම්හල් බලපත්‍ර සංඛ්‍යාව කොපමණද;

(ii) එම බලපත්‍ර ලබා ගන්නා ලද එක් එක් පුද්ගලයාගේ නම හා ලිපිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම බලපත්‍ර ලබා දීමෙන් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව උපයා ගන්නා ලද ආදායම කොපමණද;

(iv) ඉහත බලපත්‍ර ලබා දීමේදී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සලකා බලන ලද නිර්ණායක කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2857/2023

ගරු යූ. කේ. සුමිත් උඩුකුඹුර මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ පාලිත සමාගම් සහ අනුබද්ධ ආයතන කවරේද;

(ii) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව සඳහා අනුමත කාර්ය මණ්ඩලය කොපමණද;

(iii) එම කාර්ය මණ්ඩලයේ විධායක හා කණිෂ්ඨ සේවකයන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) විධායක හා කණිෂ්ඨ කාර්ය මණ්ඩලවල එක් එක් තනතුරට අදාළ මාසික වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාවේ එක් එක් සේවකයා සහ ඔහුගේ කුටුම්භය වෙනුවෙන් ලබා දී ඇති රක්ෂණ හිමිකමේ වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3647/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මුතියංගන රජමහා විහාරය, මහියංගන රජමහා විහාරය සහ කතරගම දේවාලය ඌව පළාත තුළ පිහිටා තිබෙන බවත්;

(ii) ආගමික හා සංස්කෘතික හැදියාවන් සහිත සමාජයක් බිහි කිරීම උදෙසා බදුල්ල දිස්ත්‍රික්කය ඇතුළු ඌව පළාත තුළ රජමහා විහාරස්ථාන රාශියක් පිහිටුවා ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) බදුල්ල දිස්ත්‍රික්කයේ ඇති රජමහා විහාරස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) පුරාවිද්‍යාව හා සම්බන්ධ පනත්වලට අනුකූලව එම රජමහා විහාරස්ථාන සංරක්ෂණය කරමින් පවතින්නේද;

(iv) පස්සර, බෝගොඩ, දෝව, මුතියංගන සහ මහියංගන රජමහා විහාර සහ අනෙකුත් රජමහා විහාර සංරක්ෂණය කිරීම සඳහා මේ දක්වා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) බෞද්ධ ජනතාවගේ ආගමික සංස්කෘතික වටපිටාවට අනුකූලව සහ ඓතිහාසික උරුමය සුරක්ෂිත වන පරිදි ඉහත සංරක්ෂණ කටයුතු කිරීමට පියවර ගෙන තිබේද;

(ii) මෙම ඓතිහාසික ආගමික උරුමයන් අනාගත පරම්පරාවේ ප්‍රයෝජනය සඳහා සුරක්ෂිත කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

3678/2023

ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 1997.01.01 දින සිට 2019.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(ii) 2020.01.01 දින සිට 2020.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iii) 2021.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලද;

(iv) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා විශ්‍රාම ගන්වන ලදුව 2021.12.31 දින වනවිට මරණයට පත් වී ඇති;

ශ්‍රී ලංකා විදුහල්පති සේවය, ශ්‍රී ලංකා ගුරු උපදේශක සේවය සහ ශ්‍රී ලංකා ගුරු සේවයේ නිලධාරින් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) 1997.01.01 දින සිට 2021.12.31 දින දක්වා කාලය තුළ වැන්දඹු අනත්දරු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප ලබා ගන්නා ලද පුද්ගලයන් සංඛ්‍යාව ඉහත සඳහන් එක් එක් සේවය සහ එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේනම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 07 අඟහරුවාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) යහපාලන රජය පැවති කාලයේ සිදුවූ මහ බැංකු වංචාව සම්බන්ධයෙන් ජනාධිපති කොමිෂන් සභාවක් පිහිටුවනු ලැබූ දිනය කවරේද;

(ii) එම කොමිෂන් සභාවේ සටහන් වූ සාක්ෂි සටහන්වලට අනුව එම ක්‍රියාවට සෘජුව හා වක්‍රව සම්බන්ධ බවට චෝදනා එල්ල වූ පුද්ගලයින් සංඛ්‍යාව කොපමණද;

(iii) එසේ නම් එම පුද්ගලයින්ගේ නම් හා තනතුරු නාම කවරේද;

(iv) එම පුද්ගලයින්ට එරෙහිව ගෙන ඇති නීතිමය ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3506/2023

ගරු ගෙව්න්දු කුමාරතුංග මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරින් සඳහා පවත්වාගෙන යනු ලබන අර්ථසාධක අරමුදලේ ගිණුම් ශේෂය වෙනුවෙන් 2022 වර්ෂයේදී ලබා දී ඇති පොලී අනුපාතය කවරේද;

(ii) සේවක අර්ථසාධක අරමුදලේ (E.P.F) ගිණුම් ශේෂය වෙනුවෙන් 2022 වර්ෂයේදී ලබා දී ඇති පොලී අනුපාතය කවරේද;

(iii) සේවා නියුක්තකයින්ගේ භාරකාර අරමුදලේ (E.T.F) ගිණුම් ශේෂය සඳහා 2022 වර්ෂයේදී ලබා දී ඇති පොලී අනුපාතය කවරේද;

(iv) ඉහත සඳහන් එක් එක් අරමුදල්වල ගිණුම් ශේෂ සඳහා ලබා දෙන ලද පොලී අනුපාත අතර වෙනසක් පවතී නම්, ඊට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3514/2023

ගරු අසංක නවරත්න මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කුරුණෑගල දිස්ත්‍රික්කයේ රජයේ පාසල්වල මේ වනවිට සේවය කරනු ලබන විදුහල්පතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් විදුහල්පතිවරයාගේ නම, රාජකාරි ලිපිනය, පෞද්ගලික ලිපිනය, දුරකථන අංකය, විදුහල්පති තනතුරට පත් කරන ලද දිනය, මේ වනවිට දරන ශ්‍රේණිය සහ විශ්‍රාම යාමට නියමිත දිනය වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ පාසලක විදුහල්පති ධූරය දැරිය හැකි කාලය සම්බන්ධයෙන් රේඛීය අමාත්‍යාංශය මඟින් හෝ වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය මඟින් තීරණයක් ගෙන තිබේද;

(ii) එසේ නම්, එම තීරණය කවරේද;

(iii) විදුහල්පතිවරුන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් 2023.01.01 දිනෙන් පසු වයඹ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් ගෙන ඇති ප්‍රතිපත්තිමය තීරණ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3521/2023

ගරු උද්දික ප්‍රේමරත්න මහතා,— ජනමාධ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සියලුම වර්ගවලට අයත් චිත්‍රපට තිරගත කිරීම සඳහා පහසුකම් ඇති ශ්‍රී ලංකාවේ සිනමාහල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සිනමාහල් තුළින් උපයනු ලබන වාර්ෂික ආදායම කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ සිනමා කර්මාන්තය තුළින් උපයනු ලබන ආදායම වැඩි කර ගැනීම සඳහා සැලසුම් සකස් කර තිබේද;

(iv) එසේ නම්, එම සැලසුම් කවරේද;

(v) සිනමා කර්මාන්තයේ අනාගතය සහ අභිවෘද්ධිය උදෙසා වන සැලසුම් සකස් කර තිබේද;

(vi) එසේ නම්, එම සැලසුම් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3539/2023

ගරු විමලවීර දිසානායක මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2010 සිට 2022 දක්වා ශ්‍රී ලංකාව විසින් කරන ලද අපනයනයන්හි වටිනාකම;

(ii) එම කාල සීමාවේදී ශ්‍රී ලංකාව විසින් කරන ලද අපනයනවලින් ලැබූ විදේශ විනිමය ආදායම;

එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2010 සිට 2022 දක්වා ශ්‍රී ලංකාවට කරන ලද ආනයන සඳහා අනුමත කරගත් විදේශ විනිමය ප්‍රමාණය;

(ii) එම කාල සීමාවේදී ශ්‍රී ලංකාවට කරන ලද ආනයනයන්හි වටිනාකම;

එක්සත් ජනපද ඩොලර්වලින් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3549/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර, හොරණ සහ මතුගම යන එක් එක් අධ්‍යාපන කලාපයේ ඇති දෙමළ මාධ්‍ය පාසල් සංඛ්‍යාව;

(ii) එම එක් එක් අධ්‍යාපන කලාපයේ මේ වනවිට පවතින දෙමළ මාධ්‍ය ගුරු පුරප්පාඩු සංඛ්‍යාව;

(iii) මෑතකදී විද්‍යාපීඨ ඩිප්ලෝමාධාරීන්ට ගුරු පත්වීම් ලබා දීමේදී, ඉහත සඳහන් එක් එක් අධ්‍යාපන කලාපයට පත් කරන ලද දෙමළ මාධ්‍ය ගුරුවරුන් සංඛ්‍යාව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) සිසුන් 620ක් පමණ ඉගෙනුම ලබන කළුතර අධ්‍යාපන කලාපයේ ඇති කළු/අල්-හසනියා මහා විද්‍යාලයේ ගණිත ගුරුවරයෙකුගේ පුරප්පාඩුව ඇතුළුව මේ වනවිට ගුරු පුරප්පාඩු 15ක් පමණ පවතින බව දන්නේද;

(ii) එසේ නම්, එම ගුරු පුරප්පාඩු පිරවීමට පියවර ගන්නේද;

(iii) ඉහත පාසලේ ප්‍රමාණවත් පරිදි ගොඩනැගිලි පහසුකම් නොමැති බව දන්නේද;

(iv) දානපතියන්ගේ සහයෝගයෙන් ඉදිකරමින් පවතින පන්ති කාමර 12කින් යුත් තෙමහල් ගොඩනැගිල්ලේ ඉදිකිරීම් කටයුතු මේ වනවිට අවසන් අදියරේ පවතින බව දන්නේද;

(v) එම පන්ති කාමර 12 සඳහා මේස හා පුටු ලබා දීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3570/2023

ගරු ලලිත් එල්ලාවල මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජයේ සේවයෙන් විශ්‍රාම ගැන්වීමෙන් පසු රජයේ සේවකයන්ට මාසික විශ්‍රාම වැටුප ගෙවීම ආරම්භ කිරීමට මාස දහයකට අධික කාලයක් ගතවන බවත්;

(ii) එම ප්‍රමාදය හේතුවෙන් සමහර රජයේ සේවකයන් සිය ප්‍රථම විශ්‍රාම වැටුප ලැබීමට පෙර මිය යන අවස්ථා ඇති බවත්;

(iii) එම ප්‍රමාදය රජයේ සේවකයන්ට කරනු ලබන දැඩි අසාධාරණයක් බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් ප්‍රමාදයට හේතු කවරේද;

(ii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) එම ප්‍රමාදය වළක්වා ගැනීම සඳහා විධිමත් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) එසේ නම්, එම වැඩපිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3596/2023

ගරු හර්ෂණ රාජකරුණා මහතා,— අග්‍රාමාත්‍යතුමා සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ජනාධිපති ලේකම් කාර්යාලයේ පවත්වාගෙන යනු ලබන විශේෂ ව්‍යාපෘති ඒකකය විසින් 2022 .07.14 දින සිට ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ඒකකයේ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, තනතුර, වැටුප් හා දීමනා සහ ලබා දී ඇති වාහන ඇතුලු පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම ඒකකයේ සේවය කරනු ලබන සමස්ථ කාර්යය මණ්ඩලයම දේශපාලන පක්ෂයක පූර්ණකාලීකයන් ලෙස කටයුතු කරන බව දන්නේද;

(v) එම ඒකකය නඩත්තු කිරීම සඳහා මාසිකව වැය කරනු ලබන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

3645/2023

ගරු වඩිවේල් සුරේෂ් මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ බදුල්ල ඩිපෝව මඟින් බදුල්ල නගරයේ සිට දෙමෝදර හරහා වේවැල්හින්න දක්වා; මඩොල්සීම-කුරුවිගොල්ල හරහා කොකාගල දක්වා; ලුණුගල හරහා පල්ලේකිරුව දක්වා; දෙමෝදර හරහා ඕතුඹ දක්වා; රොකතැන්න දක්වා සහ රොසට් දක්වා ධාවනය කරන ලද බස්රථ ඇතුළු වෙනත් අතුරු මාර්ග රැසක බස්රථ ධාවනය කිරීම මේ වනවිට සිදු නොකරන බවත්;

(ii) මේ හේතුවෙන් වතු ආශ්‍රිත ප්‍රදේශවල පාසල් ළමුන් සහ විවිධ අවශ්‍යතා සඳහා බදුල්ල නගරයට පැමිණෙන ජනතාව දැඩි අපහසුතාවයට පත් වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් බස්රථ සේවාවන් නැවත ධාවනය කරවීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) එම සේවාවන් නැවත ආරම්භ කරනු ලබන දින කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3672/2023

ගරු කේ. සුජිත් සංජය පෙරේරා මහතා,— නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නාගරික සංවර්ධන හා නිවාස අමාත්‍යාංශයේ සේවය කරන ලද අනියම්, ආදේශක, කොන්ත්‍රාත් සහ තාවකාලික සේවකයන් වර්තමාන රජය බලයට පත් වීමෙන් පසුව සේවයෙන් ඉවත් කර තිබේද;

(ii) එසේ ඉවත් කර ඇති සේවක සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් සේවකයාගේ නම, ලිපිනය සහ දුරකථන අංකය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) ඔවුන් ඉවත් කිරීමට හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉවත් කරන ලද එම සේවකයන් නැවත සේවයට කැඳවන්නේද;

(ii) එසේ නම්, එම දිනය කවරේද;

(iii) එම සේවකයන් සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2023 නොවැම්බර් 08 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

387/2023

ගරු නීතිඥ වසන්ත යාපාබණ්ඩාර මහතා,— ප්‍රවාහන හා මහාමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2021 වර්ෂයේ, වර්ෂා කාලයේදී නාය යාමට ලක් වූ කොළඹ-මහනුවර ප්‍රධාන බස් මාර්ගයේ, පහළ කඩුගන්නාව ප්‍රදේශයේ, ඉහළ කොටසේ, දුම්රිය මාර්ගයට ආසන්න ප්‍රදේශයේ, නායයෑමේ අවදානම මේ වනතෙක් පහ වී නොමැති බවත්;

(ii) ඉහත ප්‍රදේශයේ පාංශු ස්ථරයේ අභ්‍යන්තරයෙන් ගලා බසින ජලය, ජාතික ගොඩනැඟිලි පර්යේෂණ සංවිධානය විසින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබුවද, තවදුරටත් එම ප්‍රදේශය දැඩි අවදානම් කලාපයක් ලෙස නම් කර තිබෙන බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත ප්‍රදේශය අවදානම් තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා මේ වනවිට ගෙන ඇති ස්ථිර ක්‍රියාමාර්ග කවරේද;

(ii) කොළඹ සිට මහනුවර දක්වා ගමන් කිරීම සඳහා ඇති විකල්ප මාර්ග සංවර්ධනය කිරීමට අවධානය යොමු කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) කඩුගන්නාවේ සිට බලන දුම්රිය ස්ථානය දක්වා වූ දුම්රිය මාර්ග කොටස නිරතුරුවම නාය යෑම්වලට ලක් වීමේ අවදානමක් පවතින බැවින් ඒ සඳහා යම් පියවරක් ගත හැකිද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

423/2023

ගරු ගයන්ත කරුණාතිලක මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) විදුලි බිල්පත් සඳහා දැරීමට සිදුවන වියදම අඩු කිරීම සඳහා රාජ්‍ය සේවකයන් වෙනුවෙන් 2021 වර්ෂයේ අයවැය මඟින් යෝජනා කරන ලද 'සූර්ය බල විදුලි පහසුකම් විශේෂ ණය යෝජනා ක්‍රමය' ක්‍රියාත්මක වන්නේද;

(ii) එසේ නම්, එම ණය යෝජනා ක්‍රමය ආරම්භ කරන ලද දිනය කවරේද;

(iii) එම ණය යෝජනා ක්‍රමය යටතේ එක් රාජ්‍ය සේවකයෙකු සඳහා ලබා දීමට අපේක්ෂිත ණය මුදල සහ ඊට අදාළ පොලී අනුපාතය කොපමණද;

(iv) එම ණය යෝජනා ක්‍රමය යටතේ මේ වනවිට ණය ලබා දී ඇති රාජ්‍ය සේවකයන් සංඛ්‍යාව හා ලබා දී ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

436/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) කිලෝග්‍රෑම් 1ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක් සහ ග්‍රෑම් 400ක් බරැති සම්පූර්ණ යොදය සහිත හා යොදය රහිත කිරිපිටි පැකට්ටුවක්—

(i) අලෙවි කරනු ලබන මිල;

(ii) භාවිතා කර සකස් කළ හැකි කිරි ලීටර් ප්‍රමාණය;

(iii) සෑදීමට භාවිතා කරනු ලබන දියර කිරි ලීටර් ප්‍රමාණය;

එක් එක් සමාගම අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ අලෙවි කරනු ලබන දියර කිරි පැකට්වල පරිමාව සහ එම පරිමාව අනුව එක් එක් දියර කිරි පැකැට්ටුවක මිල වෙන් වෙන් වශයෙන් කොපමණද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

690/2023

ගරු ෂානක්කියන් රාජපුත්තිරන් රාසමාණික්කම් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මඩකලපුව දිස්ත්‍රික්කයේ, කලවන්චිකුඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, තුරෙයිනීලාවනෙයි ප්‍රදේශයේ ඇති ග්‍රාමීය රෝහල මේ වනවිට ප්‍රාදේශීය රෝහලක් ලෙස උත්ශ්‍රේණිගත කර ඇති බවත්;

(ii) ඉහත රෝහල සඳහා වෛද්‍යවරුන් දෙදෙනෙකු පත් කළ යුතු වුවත් මේ වනවිට පත් කර ඇත්තේ එක් වෛද්‍යවරයෙකු පමණක් බවත්;

(iii) එම වෛද්‍යවරයාට වෙනත් රෝහලකද රාජකාරී ආවරණය කිරීමට සිදු වී ඇති බැවින් ප්‍රදේශයේ ජනතාව පීඩාවට පත් වී ඇති බවත්;

(iv) මුල් කාලයේ දී ඉහත රෝහලේ ගිලන් රථයක් පැවතියද මේ වනවිට ගිලන්රථයක් නොමැති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) ඉහත රෝහල සඳහා මේ දක්වා ස්ථිර වෛද්‍යවරයෙක් පත් නොකිරීමට හේතු කවරේද;

(ii) එම රෝහල සඳහා ගිලන් රථයක් ලබා නොදීමට හේතු කවරේද;

(iii) ඉහත රෝහල සඳහා ස්ථිර වෛද්‍යවරයෙක් පත් කිරීමට සහ ගිලන් රථයක් ලබා දීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

819/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— කාන්තා, ළමා කටයුතු හා සමාජ සවිබලගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ස්වාමියා මිය යෑම / අතහැර යෑම හා වෙනත් හේතූන් මත ශ්‍රී ලංකාවේ සැළකිය යුතු කාන්තාවන් පිරිසක් සිය පවුල් ඒකකයේ ගෘහමූලිකයා බවට පත් වී ඇති බව දන්නේද;

(ii) එසේ නම්, සිය පවුල් ඒකකයේ ගෘහමූලිකයා ලෙස කටයුතු කරනු ලබන කාන්තාවන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම කාන්තාවන්ට සහන සැලසීම සඳහා වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරන්නේද;

(iv) ස්වාමියා මිය යෑම / අතහැර යෑම හා වෙනත් හේතූන් මත අසරණ තත්ත්වයකට පත් වී ඇති පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) මිය යෑම / අතහැර යෑම හා වෙනත් හේතූන් මත සිය භාර්යාව නොමැතිව ස්වාමියා විසින් දරුවන් රැකබලා ගනු ලබන පවුල් ඒකක සංඛ්‍යාව කොපමණද;

(ii) එම පවුල් ඒකකවලට සහන සැලසීම සඳහා ක්‍රියාත්මක කරනු ලබන වැඩපිළිවෙළ කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

839/2023

ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) බස්නාහිර පළාතේ අධ්‍යාපන කලාප අතරින් ගුරු අතිරික්තයක් හා ගුරු හිඟයක් පවතින අධ්‍යාපන කලාප කවරේද;

(ii) එම අතිරික්ත ගුරුවරුන් සංඛ්‍යාව සහ හිඟ ගුරුවරුන් සංඛ්‍යාව එක් එක් විෂය අනුව කොපමණද;

යන්න එතුමා වෙන් වෙන් වශයෙන් මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

853/2023

ගරු ගාමිණී වලේබොඩ මහතා,— මහජන ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහතුන්වන ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා වෙත පොලිස් බලතල පැවරිය යුතු බවට වර්තමාන රජයේ ප්‍රධානීන් ප්‍රකාශ කර ඇති බව දන්නේද;

(ii) මේ වනවිට මධ්‍යම ආණ්ඩුව සතුව පවතින පොලිස් බලතල, පළාත් සභා වෙත පැවරීම සඳහා සැලැසුම් කර තිබේද;

(iii) ඒ හේතුවෙන් මේ වනවිට ශ්‍රී ලංකා පොලීසිය සහ ඊට අදාළ අනෙකුත් ආයතන සඳහා වැය කරනු ලබන වියදම් සංශෝධනය වන්නේද;

(iv) එසේ නම්, එම සංශෝධනය වන මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් මේ වනවිට පවතින ශ්‍රී ලංකා පොලිසියේ බඳවාගැනීමේ පටිපාටියේ සිදු වන වෙනස්කම් කවරේද;

(ii) පළාත් සභා වෙත පොලිස් බලතල ලබා දීමෙන් අවි ආයුධ මිලදී ගැනීමේ බලතල සෘජුවම පළාත් පොලිසි වෙත හිමිවේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

874/2023

ගරු රෝහණ බංඩාර මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ස්ථාපිත කර ඇති මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම මත්ස්‍ය අභිජනන මධ්‍යස්ථාන තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

## 2023 නොවැම්බර් 09 බ්‍රහස්පතින්දා

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1317/2023

ගරු මොහමඩ් මුසම්මිල් මහතා,— අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (3)

(අ) (i) ශ්‍රී ලංකාවේ මේ වනවිට ක්‍රියාත්මක වන කාති උසාවි සංඛ්‍යාව කොපමණද;

(ii) කාති උසාවි මඟින් ලබා දෙන ලද තීන්දු අනුව වර්ෂ 2015 සිට මේ දක්වා සිදු වී ඇති දික්කසාද සංඛ්‍යාව කොපමණද;

(iii) කාති උසාවිවල සේවය කරන වයස අවුරුදු 60 ඉක්මවූ කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(iv) උපාධි සුදුසුකම් සහිත කාතිවරුන් සංඛ්‍යාව කොපමණද;

(v) කාන්තිවරුන් තෝරාගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1464/2023

ගරු මායාදුන්න චින්තක අමල් මහතා,— ධීවර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති ධීවර සමුපකාර සමිති සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට එම සමිතිවල සාමාජිකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) ධීවර සමුපකාර සමිති වැඩිම සංඛ්‍යාවක් ඇති දිස්ත්‍රික්කය කවරේද;

(iv) ධීවර සමුපකාර සමිති ප්‍රවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1512/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතනවල ඇති වාහන සංඛ්‍යාව;

(ii) එම වාහන අතරින් සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩලවල ඇති වාහන සංඛ්‍යාව;

(iii) කුලී පදනම මත රජයේ ආයතනවලට ලබා ගෙන ඇති වාහන සංඛ්‍යාව;

(iv) කුලී පදනම මත ලබා ගෙන ඇති වාහන සඳහා ගෙවනු ලබන වාර්ෂික කුලී මුදල;

කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1550/2023

ගරු රාජිකා වික්‍රමසිංහ මහත්මිය,— වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2019 සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ කුරුඳු වගාකරුවන් අතර බෙදා දී ඇති කුරුඳු පැල සංඛ්‍යාව කොපමණද;

(ii) එක් කුරුඳු වගාකරුවෙක් වෙත ලබා දී ඇති කුරුඳු පැල සංඛ්‍යාව කොපමණද;

(iii) එම කුරුඳු පැල බෙදා දී ඇති ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) කුරුඳු පැලවලට අමතරව කුරුඳු වගාකරුවන්ට ලබා දෙනු ලබන වෙනත් පහසුකම් කවරේද;

(ii) වර්ෂ 2019 සිට මේ දක්වා කුරුඳු වගාව ප්‍රවර්ධනය කිරීම සඳහා වැය කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1586/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— ආරක්ෂක අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) කළුතර දිස්ත්‍රික්කයේ නිරන්තරයෙන් ගංවතුර තත්ත්වයන් ඇති වන බවත්;

(ii) වර්ෂයකට දෙතුන් වතාවක් ගංවතුරෙන් යටවන ප්‍රදේශ එම දිස්ත්‍රික්කයේ පවතින බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) (i) කළුතර දිස්ත්‍රික්කයේ ගංවතුර ඇති වීම පාලනය කිරීම සඳහා අනුගමනය කරනු ලබන ක්‍රමවේදය කවරේද;

(ii) එම දිස්ත්‍රික්කයේ ගංවතුර පාලනය කිරීම සඳහා මේ වනවිට සකස් කර ඇති සැලසුම් කවරේද;

(iii) එම සැලසුම් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රදේශ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1718/2023

ගරු තුෂාර ඉඳුනිල් අමරසේන මහතා,— මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට මේ දක්වා මෙරටට ලැබුණු විදේශ ප්‍රේෂණවල වටිනාකම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම වටිනාකම, සමස්ථ විදේශ විනිමය ඉපයීම්වල ප්‍රතිශතයක් ලෙස ඉහත සඳහන් එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) නීත්‍යානුකූල ක්‍රමවේද ඔස්සේ ශ්‍රී ලංකාවට විදේශ මුදල් ප්‍රේෂණය කිරීම දිරිමත් කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2020/2023

ගරු කිංස් නෙල්සන් මහතා,— වරාය, නාවික හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා වරාය අධිකාරිය යටතේ මහපොළ අභ්‍යාස ආයතනය (මහපොළ වරාය හා සමුද්‍රීය විද්‍යායතනය) ක්‍රියාත්මක වන බව දන්නේද;

(ii) එම ආයතනය විසින් මේ වනවිට පවත්වනු ලබන පාඨමාලා සංඛ්‍යාව කොපමණද;

(iii) එම එක් එක් පාඨමාලාව කවරේද;

(iv) එම ආයතනය ශ්‍රී ලංකාවේ අනාගත ආර්ථික සංවර්ධනයට යොදා ගනු ලබන ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2397/2023

ගරු ඉෂාක් රහුමාන් මහතා,— කර්මාන්ත අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අනුරාධපුර දිස්ත්‍රික්කයේ ඇති රජයේ පේෂකර්ම මධ්‍යස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම මධ්‍යස්ථානවල සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) පේෂකර්මාන්ත නිෂ්පාදන පසුබෑමකට ලක් වී ඇති බව පිළිගන්නේද;

(iv) පේෂකර්මාන්ත නිෂ්පාදන නගාසිටුවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(v) ඒවා ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදන වෙන්කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2552/2023

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වයස අවුරුදු 60 සම්පූර්ණ වීම මත 2022.12.31 වැනි දිනට විශ්‍රාම ගන්වන ලද රජයේ ගුරුවරුන් සංඛ්‍යාව කොපමණද;

(ii) විශාල ගුරුවරුන් සංඛ්‍යාවක් එකවර විශ්‍රාම ගැන්වීම හේතුවෙන් රජයේ පාසල් පද්ධතිය අකර්මණ්‍ය වීමේ අවදානමක් තිබේද;

(iii) ඉහත විශ්‍රාම ගැන්වීම හේතුවෙන් ඇති වූ ගුරු පුරප්පාඩු පිරවීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2883/2023

ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2022 වර්ෂයේ අතුරු අයවැයෙන් පශු සම්පත් සංවර්ධනය සඳහා වෙන් කරන ලද මූල්‍ය ප්‍රතිපාදනය කොපමණද;

(ii) එයින් භාවිතා කරන ලද සහ භාවිතා නොකරන ලද ප්‍රතිපාදනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ශ්‍රී ලංකාවේ කුකුළු මස් නිෂ්පාදනය සහ කිරි නිෂ්පාදනය ප්‍රවර්ධනය කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

**2023 නොවැම්බර් 10 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1623/2023

ගරු තිස්ස අත්තනායක මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ එක් එක් වගා කන්නවල සිදු වන කාලගුණ වෙනස්වීම් හේතුවෙන් එළවළු බීජ නිෂ්පාදනයේදී ඇති වන ගැටලු සම්බන්ධයෙන් සලකා බලා එයට විසඳුමක් ලෙස හරිතාගාර තුළ එළවළු බීජ නිෂ්පාදනය කිරීම සඳහා සුදුසු වැඩසටහනක් සකස් කිරීම පිණිස 2018 වර්ෂයේදී කුණ්ඩසාලේ කෘෂිකර්ම උපදේශකවරයා විසින් කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් අනුමතිය ඉල්ලා ඇති බව දන්නේද;

(ii) ඒ සම්බන්ධයෙන් මේ වනවිට ගෙන ඇති පියවර කවරේද;

(iii) ඉහත වැඩසටහන සඳහා පුද්ගලික අංශය සතු හරිතාගාර සම්බන්ධ කර ගැනීමට අපේක්ෂා කරන්නේද;

(iv) එසේ නම්, එම හරිතාගාර ඉහත සඳහන් වැඩසටහන සඳහා සම්බන්ධකර ගනු ලබන ක්‍රමවේදය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1640/2023

ගරු මිලාන් ජයතිලක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ගෑස් හිඟ වීම සහ ගෑස් මිල අධික ලෙස ඉහළ යාම හේතුවෙන් විකල්ප බලශක්ති භාවිතා කිරීම සඳහා නව නිපැයුම් විශාල ප්‍රමාණයක් නිෂ්පාදනය කරන ලද බව දන්නේද;

(ii) එම නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීමෙන් ගෑස් ආනයනය කිරීම සඳහා වැය වන විදේශ විනිමය ඉතිරි කර ගත හැකි බව දන්නේද;

(iii) එම නව නිපැයුම් නිර්මාණකරුවන් සහ ඒවා භාවිතා කරනු ලබන පාරිභෝගිකයන් දිරිගැන්වීම සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1683/2023

ගරු චාල්ස් නිර්මලනාදන් මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ වෙංගල චෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ග්‍රාම නිලධාරි වසම් 20 ක ජීවත් වන ජනතාවගෙන් වැඩි පිරිසකගේ ප්‍රධාන ජීවනෝපාය කෘෂිකර්මාන්තය බවත්;

(ii) වෙංගල චෙට්ටිකුලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස බලප්‍රදේශය ඉතා විශාල වීම හේතුවෙන් ඊට අදාළ ගොවිජන සේවා මධ්‍යස්ථානයට ගොස් සේවා ලබා ගැනීමේදී ඉහත ගොවීන් විවිධ දුෂ්කරතාවන්ට මුහුණ දෙනු ලබන බවත්;

(iii) වෙංගල වෙට්ටිකුලම ප්‍රදේශයේ සමහර ගම්මානවල ජීවත් වන ගොවීන්ට තම කෘෂි සේවා ලබා ගැනීම සඳහා ගොවිජන සේවා මධ්‍යස්ථානය වෙත කිලෝ මීටර 40ක පමණ දුර ගෙවා යාමට සිදු වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) වෙංගල වෙට්ටිකුලම ප්‍රදේශයේ ජීවත් වන ගොවීන්ට කෘෂි සේවා ලබා ගැනීම සඳහා නව ගොවිජන සේවා මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීමට පියවර ගන්නේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1760/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) 2015 වර්ෂයෙන් පසු දේශපාලන පළිගැනීම්වලට ලක් වූ මධ්‍යම සංස්කෘතික අරමුදලේ සේවකයන් සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කර තිබේද;

(ii) එසේ නම්, එම විමර්ශන අනුව මේ වනවිට සහන ලබා දී ඇති සේවකයන් සංඛ්‍යාව කොපමණද;

(iii) මේ වනතෙක් සහන ලබා දී නොමැති සේවකයන්ට ඉදිරියේදී සහන ලබා දීමට කටයුතු කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1818/2023

ගරු අජිත් මාන්නප්පෙරුම මහතා,— ජල සම්පාදන හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ගම්පහ දිස්ත්‍රික්කයේ ගම්මාන අතරින් පානීය ජල පහසුකම් නොමැති ගම්මාන සංඛ්‍යාව කොපමණද;

(ii) එම ගම්මානවල නම් කවරේද;

(iii) එම ගම්මානවල ජනතාවට පිරිසිදු පානීය ජල පහසුකම් ලබා දීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2536/2023

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— සෞඛ්‍ය අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ, කන්තලේ මූලික රෝහල සඳහා අනුමත සේවක සංඛ්‍යාව සහ මේ වනවිට සේවය කරනු ලබන සේවකයන් සංඛ්‍යාව;

(ii) එම රෝහලේ සේවය කරනු ලබන වෛද්‍යවරුන් හා හෙදියන් සංඛ්‍යාව ඔවුන්ගේ සන්නිවේදන භාෂාව අනුව;

වෙන් වෙන් වශයෙන් කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත රෝහලේ මේ වනවිට පවතින පුරප්පාඩු පිරවීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

2580/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— කෘෂිකර්ම අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ස්ථාපිත කර ඇති වී පර්යේෂණ ආයතන සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවා ස්ථාපිත කර ඇති ප්‍රදේශ කවරේද;

(iii) එම එක් එක් පර්යේෂණ ආයතනය විසින් හඳුන්වා දී ඇති වී ප්‍රභේද වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) එම එක් එක් වී ප්‍රභේදය වගා කිරීම සඳහා නිර්දේශිත ඇති ප්‍රදේශ වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

2624/2023

ගරු නීතිඥ මධුර විතානගේ මහතා,— ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වර්ෂ 2015 සිට 2019 දක්වා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ යම් අක්‍රමිකතාවයක්, අයථා පත්වීමක්, දූෂණ ක්‍රියාවක් හෝ නීති විරෝධී ක්‍රියාවක් සිදු වී තිබේද;

(ii) එසේ නම්, ඒවා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) ඉහත සඳහන් එක් එක් කරුණ හේතුවෙන් රජයට අහිමි වී ඇති මූල්‍ය, දේපල හා මානව සම්පත්වල වටිනාකම වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) ඉහත (අ) (i) හි සඳහන් ක්‍රියා සඳහා වගකිව යුතු නිලධාරීන් හඳුනාගැනීමට විමර්ශන සිදු කර තිබේද;

(ii) වගකිව යුතු නිලධාරීන් හඳුනාගෙන ඇත්නම්, ඔවුන්ට එරෙහිව ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගෙන නොමැති නම්, ඊට හේතු කවරේද;

(iv) ඉදිරියේදී ඔවුන්ට එරෙහිව ක්‍රියාමාර්ග ගනු ලබන්නේද;

(v) ඉදිරියේදී සිදු විය හැකි මෙවැනි ක්‍රියා වැළැක්වීම සඳහා ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3101/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— අධ්‍යාපන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ රජයේ පාසල් සංඛ්‍යාව කොපමණද;

(ii) එම පාසල් අතරින් ශ්‍රේණිධාරී විදුහල්පතිවරුන් සහ වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වැඩබලන විදුහල්පතිවරුන් සිටින පාසල් සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වැඩබලන විදුහල්පතිවරුන්, විදුහල්පති සේවයට අන්තර්ග්‍රහණය කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා මේ වනවිට ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

(iii) ඉදිරියේදී විදුහල්පති තනතුරේ ඇති වන පුරප්පාඩු පිරවීමේදී තරඟ විභාග පවත්වා සුදුස්සන් තෝරාගැනීමට කටයුතු කරන්නේද;

(iv) එසේ නම්, එම තරඟ විභාග පවත්වනු ලබන දින වකවානු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

3156/2023

ගරු කේ. පී. එස්. කුමාරසිරි මහතා,— වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) මේ වනවිට ශ්‍රී ලංකාවේ වැව් බොහෝ ප්‍රමාණයක ආක්‍රමණික ශාඛ වර්ධනය වී ඇති බවත්;

(ii) එම ශාඛ දිරාපත් වී වැව් පතුලට කිඳාබැසීම හේතුවෙන් වැව් ගොඩ වී ඇති බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) (i) ඉහත වැව්වල ඇති ආක්‍රමණික ශාක ඉවත් කිරීම සඳහා වැඩපිළිවෙළක් තිබේද;

(ii) මේ වනවිට ගොඩවී ඇති වැව් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පවතින වැඩපිළිවෙළ කවරේද;

(iii) වැව්වල වැඩෙන ආක්‍රමණික ශාක මර්දනය කිරීම සඳහා ගොවි සංවිධාන සමඟ ඒකාබද්ධව වැඩපිළිවෙළක් සකස් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) වැව් රක්ෂිත හා වැව් බැම්ම ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

(ii) වැව් ආරක්ෂා කිරීම සඳහා ජනතාව සමඟ ඒකාබද්ධ වැඩපිළිවෙළක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 7/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— විදේශගත ශ්‍රමිකයන්ට සුබසාධනය සැලසීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය ලබාදීමට උරදෙන විදේශගත ශ්‍රමිකයින්ගේ පවුල්වල සුබසාධනය සඳහා කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.22/2023

ගරු කෝකිලා ගුණවර්ධන මහත්මිය,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් ආයතන දැඩි නියාමනයකට ලක්කිරීම,— ක්ෂුද්‍ර මූල්‍ය ආයතනවල ක්‍රියාකාරකම් හේතුවෙන් නාගරික හා ග්‍රාමීය සමාජය විශාල දෙදරායාමකට ලක් වී ඇති හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය හා කල්බදු ණය පහසුකම් සම්බන්ධයෙන් එකී ආයතනවල පෙළඹවීම මත ණය ලබාගත් විශාල පවුල් සංඛ්‍යාවක් මේ වනවිට දැඩි කම්පනයකට පත් වී ඇති හෙයින් ද, එම ආයතනවල පොලී අනුපාත විවිධ මට්ටම්වල පවතින හෙයින් ද, කල්බදු ණය පහසුකම් වාරික ගෙවීමට අපොහොසත්වන පුද්ගලයන් එම ආයතනවල විවිධ බලපෑම් හා ප්‍රචණ්ඩත්වයට ලක්වන හෙයින් ද, ක්ෂුද්‍ර මූල්‍ය ආයතන හා කල්බදු ණය පහසුකම් සපයන ආයතන දැඩි නියාමනයකට ලක් කිරීමට රජය විසින් අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.24/2023

ගරු (මහාචාර්ය) රංජිත් බණ්ඩාර මහතා,— ශ්‍රී ලංකාවේ ගුරුවරුන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— වසර ගණනාවක් එකම පාසලක් තුළ සේවය කිරීම හේතුවෙන් ගොඩනැගෙන පෞද්ගලික සබඳතා හේතුවෙන් ඇතැම් ළමුන් හට යම් යම් අවස්ථාවල දී අසාධාරණකම් ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ ස්ථරවල ළමයින් සමඟ සේවය කිරීම මඟින් ළමා මනස අවබෝධ කරගැනීමේ හැකියාව හා අත්දැකීම් ලබා ගැනීමේ අවස්ථාව අහිමිවන හෙයින් ද, දේශපාලන, සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන අධ්‍යාපන ක්‍රමවේදයක් පවත්වා ගැනීමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, සමාජයේ විවිධ උප සංස්කෘතීන් අවබෝධ කර ගැනීමට ඇති අවස්ථා ගිලිහී යන හෙයින් ද, විවිධ ප්‍රාදේශීය භාෂාවන් සහ ප්‍රාදේශීය සංස්කෘතීන්ගෙන් අත්දැකීම් ලබා ගැනීමට ඇති අවස්ථා අල්ප වන හෙයින් ද, අධ්‍යාපනය ලබාදීම සහ යහපත් සමාජ පුරවැසියකු බිහි කිරීම යන ඒකායන අරමුණ ඉටුවන අධ්‍යාපන ක්‍රමවේදයක් ඇති කිරීම උදෙසා සියලුම ගුරුවරුන් හට වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබා දීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.23/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සංවර්ධන කටයුතු සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීම,— පාසල් සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය මූල්‍යමය ප්‍රතිපාදන වාර්ෂිකව දෙමව්පියන්ගෙන් අයකර ගැනීම අඛණ්ඩව සිදුවන හෙයින් ද, වර්තමාන ආර්ථික අර්බුදය හමුවේ ඇතැම් දෙමව්පියන් හට එම මූල්‍ය ප්‍රතිපාදන සැපයීමට අපහසු වීම හේතුවෙන් එකී දෙමව්පියන්ගේ දරුවන් පන්ති කාමර තුළ දී අපහසුතාවයන්ට ලක්වීමට ඉඩ ඇති හෙයින් ද, පාසල් සංවර්ධන කටයුතුවලට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන සම්පාදනය කරගත යුතු ආකාරයත්, එම මූල්‍ය අයවැය වාර්තා ප්‍රදර්ශනය කළ යුතු ආකාරයත්, එකී සංවර්ධන කටයුතු සඳහා පසු විපරම් කටයුතු කළ යුතු ආකාරයත් සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු ක්‍රමවේදය ඇතුළත් චක්‍රලේඛයක් නිකුත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 3/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— කඩා වැටුණු මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම,— රටක ආර්ථික සංවර්ධනය හා මූල්‍ය වෙළඳපොළ කෙරෙහි සුවිශේෂී බලපෑමක් මූල්‍ය ආයතන හරහා සිදුවුවත්, පසුගිය කාලය පුරා මෙරට මූල්‍ය ආයතන කිහිපයක් කඩා වැටීමකට ලක් වී ඇති හෙයින් ද, එහි තැන්පතුකරුවන් පොදුවේ ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටින හෙයින් ද, එම මූල්‍ය ආයතන යළි නඟා සිටුවීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 4/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— දේශීය ටින්මාළු නිෂ්පාදනය වැඩි කිරීම,— ශ්‍රී ලංකාව වටා මුහුද තිබියදී රටට අවශ්‍ය ටින්මාළු ආනයනය සඳහා වාර්ෂිකව විශාල මුදලක් විදේශ රටවල් කරා ඇදී යන හෙයින්, එම තත්ත්වය වැළැක්වීම සඳහා දේශීය ටින්මාළු කර්මාන්තය දියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට රජය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 6/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— පළාත් පාලන ආයතනවල අබලන් වූ වාහන අලුත්වැඩියා කිරීම,— පළාත් පාලන ආයතන බොහොමයකම අබලන් තත්ත්වයේ පවතින වාහන ගාල් කර ඇති ආකාරය ඉතා සුලභ දසුනක් වන හෙයින් ද, එම ආයතන සඳහා අලුතින් වාහන මිල දී ගැනීම වෙනුවට එම වාහන අලුත්වැඩියා කිරීම තුළින් විශාල මුදලක් ඉතිරි කර ගත හැකි හෙයින් ද, පළාත් පාලන ආයතනවල අබලන් වී ඇති වාහන අලුත්වැඩියා කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 8/2023

ගරු චමින්ද විජේසිරි මහතා,— මී පැණි කර්මාන්තය වැඩිදියුණු කිරීම,— ඉතා ඉහළ ඖෂධීය ගුණයෙන් යුතු, දේශීය හා විදේශීය වෙළෙඳපොළේ ඉහළ ඉල්ලුමක් ඇති මී පැණි කර්මාන්තය, දේශීය වශයෙන් වැඩිදියුණු කිරීමට කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 10/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— දේශීය සහල් වර්ගයන්හි පෝෂ්‍ය ගුණය පිළිබඳ ජනතාව දැනුම්වත් කිරීම,— දැනට ශ්‍රී ලංකාවේ වෙළඳපොළ තුළ දක්නට ලැබෙන පැරණි දේශීය සහල් හා දැනට භාවිත කරන නව සහල් වර්ගයන්ගේ ඇති පෝෂ්‍ය ගුණය පිළිබඳව ද, විවිධ රෝගාබාධ ඇති අය භාවිත කළ යුතු සහල් වර්ග පිළිබඳව ජනතාව දැනුවත් කිරීම මෙන්ම, ගොවි ජනතාවට එම වී වර්ග වගා කිරීමට පහසුකම් සලසාදීම පිළිබඳව ද, රජය විසින් ජාතික මට්ටමේ වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 11/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ආක්‍රමණික පැළෑටි හා සතුන් හේතුවෙන් ජෛව විවිධත්වයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හානි විය හැකි ආක්‍රමණික පැළෑටි හා සතුන් හඳුනාගෙන, ඒවා නම්කිරීම මඟින් එම පැළෑටි හා සතුන් බෝ කිරීම හා ආනයනය කිරීම තහනම් කර ශ්‍රී ලංකාවේ පරිසරය ආරක්ෂා කිරීමට රජය මැදිහත් වී කඩිනමින් අවශ්‍ය නීති සම්පාදන කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල ශිෂ්‍ය/ ශිෂ්‍යාවන් විසින් කරනු ලබන පර්යේෂණ නිබන්ධන අදාළ අමාත්‍යාංශවල සංවර්ධන කටයුතු ඉලක්ක කරගනිමින් සකස් කිරීම,— ශ්‍රී ලංකාව තුළ දැනට පවතින විශ්වවිද්‍යාල හා වෙනත් තෘතීයික අධ්‍යාපන ආයතනවල අධ්‍යාපනය ලබන සිසුන් විසින් හදාරනු ලබන පාඨමාලා සම්බන්ධයෙන් සිදු කරනු ලබන පර්යේෂණ නිබන්ධන ශ්‍රී ලංකාවේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික වර්ධනයට අදාළව සිදු කිරීම වැදගත් වන හෙයින් ද, මෙම නිබන්ධන අධීක්ෂණය කරනු ලබන ආචාර්යවරුන් හා එකී පර්යේෂණ නිබන්ධනවලට අදාළ අමාත්‍යාංශය අතර මනා සම්බන්ධීකරණයක් සිදු කිරීම සඳහා එක් එක් අමාත්‍යාංශ මට්ටමින් වගකිව යුතු නිලධාරියකු පත් කළ යුතු හෙයින් ද, අදාළ අමාත්‍යාංශයන් හි ඉදිරි සංවර්ධන ක්‍රියාදාමයන් සිදු කිරීමේ දී දිගුකාලීන, මධ්‍යකාලීන සහ කෙටිකාලීන ඉලක්ක සපුරා ගැනීම සඳහා එකී නිබන්ධන යොදා ගැනීමට ක්‍රමවත් වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.13/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ලොව පුරා ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීමට පෙරමුණ ගැනීම,— ලොව පුරා සිටින බෞද්ධයන්ගේ වන්දනාවට පාත්‍රවන බෞද්ධ සිද්ධස්ථානවල ආරක්ෂාව තර කිරීමට හා අන්තර්ජාතික වශයෙන් බෞද්ධයන් වෙනුවෙන් හඬක් නැඟිය හැකි ශක්තිමත් සංවිධානයක් ගොඩනැගීම සඳහා ලොව පුරා සිටින බෞද්ධ නායකයන් හා සංවිධාන ඒකරාශී කිරීමට ශ්‍රී ලංකාව මූලිකත්වය ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— වැඩිහිටි නඩත්තු මණ්ඩල දිවයින පුරා ව්‍යාප්ත කිරීම,— ජීවිතයේ සැඳෑ සමය ගත කරමින් සිටින වැඩිහිටියන්ට තම පවුලේ සාමාජිකයන්ගෙන් මෙන්ම ඇතැම් ආයතනවලින් නොසලකා හැරීම් නිසා සිදුවන විවිධ අසාධාරණ සම්බන්ධයෙන් පැමිණිලි කිරීම සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශයේ, වැඩිහිටි තැනැත්තන් සඳහා වන ජාතික සභාව සහ මහලේකම් කාර්යාලය යටතේ ක්‍රියාත්මක වන වැඩිහිටි නඩත්තු මණ්ඩල වැඩපිළිවෙළ පළාත්, දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් ව්‍යාප්ත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රියාවලියට බද්ධ කිරීම,— ශ්‍රී ලංකාවේ ආහාර කලාව, රසකාරක හා සංයෝග කිරීමේ කලාව, ආහාර පිසීමේ කලාව, වර්ණකාරක කලාව, ආහාර කැපීමේ කලාව ඇතුළු අංග ගණනාවකින් සමන්විත වන බැවින්, ශ්‍රී ලාංකික ආහාර සංස්කෘතිය පිළිබඳ ඉගෙනුම්, ඉගැන්වීමේ ක්‍රමවේදයන් හරහා අනාගත පරපුරට පවරාදීම මඟින් දේශීය හා විදේශීය ජනතාව අතර අප රටේ ආහාර සංස්කෘතිය ව්‍යාප්ත කිරීමට මෙන්ම ශ්‍රී ලාංකීය අනන්‍යතාවය ලෝකය තුළ ඔසවා තැබීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— අන්තර්ජාලය ඔස්සේ අළෙවි කිරීම මඟින් සිදු කරන ඖෂධ ජාවාරම මැඩපැවැත්වීම,— වර්තමානය වනවිට අන්තර්ජාලය ඔස්සේ ප්‍රමිතියකින් තොර ඖෂධ, වෛද්‍ය උපකරණ හා රූපලාවණ්‍ය නිෂ්පාදන විශාල ලෙස අළෙවි කරන බැවින් ද, මෙය අප රටේ ජනතාවගේ ජීවිතාරක්ෂාවට විශාල තර්ජනයක් වන බැවින් ද, මෙම තත්ත්වය මැඩපවත්වා ගැනීම සඳහා නිසි වැඩපිළිවෙළක් රජය විසින් සකසා ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 17/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— පාසල් දරුවන්ගේ වටිනාකම සමාජගත කිරීම,— පාසැල් දරුවන් නිරන්තරයෙන් ඇසුරු කරන දෙමාපියන්, ගුරුවරුන්, ක්‍රීඩා පුහුණුකරුවන්, පාසැල් වෑන් රථ රියැදුරන් ආදී පුද්ගලයන්හට දරුවන්ගේ වටිනාකම පිළිබඳ සමාජ විද්‍යාත්මක හා මනෝවිද්‍යාත්මක ක්‍රමවේද තුළින් සරලව පැහැදිලි කර රටේ හා සමාජයේ ඉදිරි යහපැවැත්ම වෙනුවෙන් දරුවන් සමාජ අභියෝග හමුවේ ආරක්ෂා කළ යුතු ආකාරය පිළිබඳ දැනුම්වත් කිරීමේ ජාතික මට්ටමේ වැඩසටහනක් රජය විසින් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/2023

ගරු බුද්ධික පතිරණ මහතා,— ණය ක්‍රමයක් මඟින් වැඩිහිටි ප්‍රජාවගේ ආර්ථිකය ශක්තිමත් කිරීම,— වයස අවුරුදු 60 ඉක්මවා ඇති වැඩිහිටි ප්‍රජාවෙහි ජීවනෝපාය මාර්ග ශක්තිමත් කර දීමෙන් සමස්ත ශ්‍රී ලංකා ආර්ථිකයේ නිෂ්පාදනය වර්ධනය කිරීම සඳහා ඔවුන්ව දායක කර ගත හැකි වන හෙයින් ද, මෙම වැඩිහිටි ප්‍රජාව සඳහා බැංකු පද්ධතිය මඟින් ණය පහසුකම් ලබා නොදීම හේතුවෙන් ඔවුන්ට සමාජය තුළ වෙනස්ව සැලකීමක් සිදුවන හෙයින් ද, බැංකු පද්ධතිය මඟින් වයස අවුරුදු 60 ඉක්මවන්නන් හට ණය දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.25/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකීමක් සහිත වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම,— අතීතයේ දී ශ්‍රී ලංකාවේ රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතන විසින් කාර්යාල උපකරණ සඳහා යොදා ගනු ලැබූ දැව භාණ්ඩ දීර්ඝ කාලයක් භාවිත කළ ද වර්තමානයේ දී එම ආයතන භාවිත කරන කාර්යාල උපකරණ ප්ලයිවුඩ් ෂීට් හා අනෙකුත් කෘත්‍රිම ෂීට් වර්ග යොදා සකස් කරන හෙයින් ඉතා කෙටි කාලයකින් ඒවා විනාශ වන හෙයින් ද, මෙම වත්මන් කාර්යාල උපකරණ සකස් කිරීම සඳහා විදේශ රටවලින් අමුද්‍රව්‍ය ආනයනය කිරීම හේතුවෙන් විශාල වශයෙන් විදේශ රටවලට මුදල් ගලායාම සිදුවන හෙයින් ද, අපගේ පරිසර පද්ධතියට ඉවතලන මෙම ද්‍රව්‍යවලින් දැඩි බලපෑමක් එල්ලවන හෙයින් ද, රජයේ ආයතන සඳහා රාජ්‍ය දැව සංස්ථාවෙන් හා වගකිවයුතු වෙනත් ආයතනවලින් කාර්යාල උපකරණ ලබා ගැනීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් දියත් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.31/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාරම්පරික දේශීය එළවළු හා පලතුරු බීජ නැවත ප්‍රවර්ධනය කිරීම,— අප රටේ පාරම්පරික එළවළු හා පලතුරු බීජ වර්ග වර්තමානය වනවිට හිඟ වීම හේතුවෙන් විදේශ රටවලින් බීජ ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන හෙයින් ද, එසේ ගෙන්වනු ලබන බීජවලින් ලැබෙන එලදාවෙන් ලබා ගන්නා බීජ නැවත රෝපණය වීමේ හැකියාවෙන් තොර හෙයින් ද, පාරම්පරික දේශීය බීජ වර්ගවලින් හටගන්නා එලදාව කෘමි උවදුරුවලට ඔරොත්තු දීමේ විශේෂ හැකියාවකින් යුක්ත වන හෙයින් ද, වර්තමානය වනවිට ශ්‍රී ලංකාවෙන් ක්ෂය වෙමින් පවතින පාරම්පරික දේශීය එළවළු හා පලතුරු බීජ නැවත ප්‍රවර්ධනය කිරීම සඳහා ජාතික වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.32/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— වෘත්තිකයන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කිරීමට වෘත්තීය පුහුණු විෂයභාර අමාත්‍යාංශයට අනුයුක්ත ආයතනයක් ස්ථාපනය කිරීම,— ශ්‍රී ලංකාවේ විවිධ වෘත්තීන්වල යෙදෙන පුද්ගලයන් අතර ආයතනවලින් පුහුණුවූවන් මෙන්ම සහජ හැකියාවෙන් එම වෘත්තීන්වල යෙදෙන්නන් සිටින හෙයින් ද, පෙදරේරු, ලී වැඩ, මෝටර් කාර්මික වැද්දුම්, පින්තාරු ආදී ක්ෂේත්‍රවල යෙදෙන්නන් ලියාපදිංචි කිරීමේ ආයතනයක් නොමැති බැවින් එකම පුද්ගලයා වෘත්තීන් කිහිපයක යෙදෙන බැවින් ද, වෘත්තිකයකු හදිසි අනතුරකට මුහුණ දී ඇති අවස්ථාවක දී වෛද්‍ය ප්‍රතිකාර ලබා දීමේ පහසුව සඳහා එම පුද්ගලයාගේ රුධිර වර්ගය පිළිබඳ තොරතුරු සහ සේවාව ලබා ගන්නා පුද්ගලයාට වෘත්තිකයාගේ අනන්‍යතාවය තහවුරු වන තොරතුරු ඇතුළත් වෘත්තීය හැඳුනුම්පතක් ලබාදීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති හෙයින් ද, වෘත්තිකයන් ලියාපදිංචි කර ඔවුන්ට හැඳුනුම්පතක් නිකුත් කිරීම සඳහා වෘත්තීය පුහුණු විෂයභාර අමාත්‍යාංශයට අනුයුක්තව ආයතනයක් ස්ථාපනය කිරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.33/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— ඒකාබද්ධ සේවයේ සහ දීප ව්‍යාප්ත සේවයේ නියුතු නිලධාරීන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීම,— රාජ්‍ය සේවය තුළ ඒකාබද්ධ සේවය හා දීප ව්‍යාප්ත සේවාවල නියුතු නිලධාරීන් එක් ස්ථානයක වසර පහකට අධික කාලයක් සේවය කිරීම හේතුවෙන් ඔවුන්ට ලබාගත හැකි අත්දැකීම් හා විශේෂ ප්‍රාගුණ්‍යය පිළිබඳ දැනුම හීනවන බැවින් ද, කලකිරීම් හා මානසික පීඩාවන් අවම වී ප්‍රබෝධමත්, උද්යෝගිමත් හා නැවුම් මානසිකත්වයකින් රාජකාරි කිරීමට ඇති අවස්ථා අහිමිවන බැවින් ද, ඇතිවන සමාජ අන්තර් සම්බන්ධතා මඟින් අක්‍රමිකතා, වංචා හා දූෂණ සඳහා පෙළඹවීමක් ඇති විය හැකි හෙයින් ද, දේශපාලන හා සමාජීය සම්බන්ධතා හේතුවෙන් ස්වාධීන සේවාවක් පවත්වාගෙන යාමට අවහිරතා ඇතිවිය හැකි හෙයින් ද, ප්‍රාදේශීය පරිපාලනයේ විවිධ අත්දැකීම් බහුලවීමේ සාධනීය බලපෑම අල්පවන හෙයින් ද, කාර්යක්ෂම හා ප්‍රශස්ථ රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීම උදෙසා ඒකාබද්ධ සේවයේ සහ දීප ව්‍යාප්ත සේවයේ නියුතුවන නිලධාරීන් සඳහා වසර පහකට වරක් ස්ථාන මාරුවීම් ලබාදීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.34/2023

ගරු නීතිඥ සාගර කාරියවසම් මහතා,— පාසල් සිසුන් සතියේ එක් දිනක් බාහිර ක්‍රියාකාරකම්වල යෙදවීම,— විවිධ කරුණු හේතුවෙන් පාසල් සිසුන් බාහිර ක්‍රියාකාරකම්වල නොයෙදීමෙන් ඔවුන්ගේ මානසික ආතතිය වර්ධනය වී ඇති බවට සමාජ විශ්ලේෂකයන් විසින් කරුණු ඉදිරිපත් කර ඇති හෙයින් ද, ක්‍රීඩා, සංගීතය, චිත්‍ර, නැටුම් වැනි සෞන්දර්ය ක්‍රියාකාරකම් හා ගෙවතු වගාව වැනි කෘෂිකාර්මික කටයුතුවල නියැලීමෙන් සිසුන්ගේ මානසික හා කායික වර්ධනය සිදුවන බව මනෝ විද්‍යාත්මකව සනාථ වී ඇති හෙයින් ද, පවත්නා තත්ත්වය සැළකිල්ලට ගෙන පාසල් අධ්‍යාපන කටයුතු පවත්වනු ලබන සතියේ දින පහෙන් සිකුරාදා වැනි එක් දිනක් අනිවාර්ය විෂය බාහිර ක්‍රියාකාරකම්වල සිසුන් යොදවා අනාගතයේ දී ඇති විය හැකි බරපතල ගැටලු නිරාකරණය කර ගැනීමට අවකාශය සැකසීමට යෝග්‍ය වැඩසටහනක් රජය විසින් කඩිනමින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.35/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අපිරිසිදු හෝටල්, බේකරි හා ආපනශාලා ප්‍රමිතගත කිරීම,— වෙළඳපොළේ පවතින හෝටල් හා බේකරි නිෂ්පාදනවල ප්‍රමිතිය හා පිරිසිදුකම අවම මට්ටමක පවතින හෙයින් ද, ඇතැම් බේකරි නිෂ්පාදනවල අපිරිසිදුකම හේතුවෙන් පාරිභෝගිකයන් ලෙඩරෝගවලට භාජනය වීමට වැඩි ඉඩකඩක් ඇති බවට ආපනශාලා හිමියන්ගේ සංගමයේ සභාපතිවරයා විසින් ම ප්‍රකාශ කර ඇති හෙයින් ද, මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය හා මහජන සෞඛ්‍ය පරීක්ෂකවරයන්ගේ මැදිහත්වීමෙන් අපිරිසිදු හෝටල්, බේකරි හා ආපනශාලා ප්‍රමිතගත කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.36/2023

ගරු ජගත් කුමාර සුමිත්‍රාආරච්චි මහතා,— අන්තර්ජාලය ඔස්සේ ගෙන්වන භාණ්ඩ ප්‍රමිතිකරණයකට ලක්කිරීම,— පාරිභෝගිකයන් විසින් විවිධ භාණ්ඩ හා සේවා අන්තර්ජාලය ඔස්සේ ලබා ගැනීමේ ඉහළ ප්‍රවණතාවයක් වර්තමානය වනවිට නිර්මාණය වී ඇති හෙයින් ද, එම භාණ්ඩ පරිභෝජනය කිරීමේ දී පාරිභෝගිකයන්ට ඇතිවන සංකූලතාවයන් සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශ්වයන් හඳුනාගැනීමේ හැකියාවක් නොමැති හෙයින් ද, මේ හේතුවෙන් සමාජය තුළ විවිධ විෂමතා හා බෙදීම් ඇති වීමෙන් ගැටුම් නිර්මාණය වීමට බොහෝ ඉඩකඩ ඇති හෙයින් ද, අන්තර්ජාලය ඔස්සේ ගෙන්වන භාණ්ඩ ප්‍රමිතිකරණයකට ලක් කිරීම සඳහා රජය විසින් ක්‍රියා කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.37/2023

ගරු ජගත් සමරවික්‍රම මහතා,— ශ්‍රී ලංකාවේ රාජ්‍ය ආයතන සතු ඉඩම්වල කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් වගා කිරීමේ වැඩසටහනක් දියත් කිරීම,— අප රටේ රාජ්‍ය ආයතන සතු ඉඩම්වල කාර්ය මණ්ඩල සහභාගිත්වයෙන් පලතුරු, එළවළු හා අලවර්ග වගා කිරීම තුළින් අතිරේක ආදායමක් උපයා ගැනීමට හැකිවන හෙයින් ද, රටේ පවතින ආහාර හිඟයට එය පිළියමක් වන හෙයින් ද, වගා කටයුතු සඳහා උනන්දුවක් දක්වන රාජ්‍ය සේවකයන් තෝරා ගෙන ඔවුන්ට ගන්නෝරුව හා වෙනත් ප්‍රදේශවල පිහිටුවා ඇති කෘෂිකර්ම පුහුණු මධ්‍යස්ථානවලින් විශේෂ පුහුණුවක් ලබා දී, දීප ව්‍යාප්ත ආහාර ප්‍රවර්ධන වැඩසටහනක් දියත් කිරීම හා ඉතා සාර්ථක වගාවන් තෝරා ජාතික මට්ටමින් ඇගයීමට ලක් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.38/2023

ගරු ජගත් සමරවික්‍රම මහතා,— කිරි ගව පාලන කටයුතු වනෝද්‍යාන තුළ සිදු කිරීම,— ශ්‍රී ලංකාව තුළ දියර කිරි හා පිටි කිරි පරිභෝජනය ඉහළ මට්ටමක පවතින හෙයින් ද, කිරි ගවයන්ට අවශ්‍ය තණකොළ සපයා ගැනීමට නොහැකිවීමෙන් කිරි ගොවීන් අධෛර්යමත් වී ඇති හෙයින් ද, දේශීය කිරි නිෂ්පාදනය ප්‍රමාණවත් නොවන බැවින් කිරිපිටි ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැයවන හෙයින් ද, අනවසර ලෙස වනෝද්‍යාන තුළ කිරි ගවයන් ගාල් කිරීම හේතුවෙන් කිරි ගොවීන් අත්අඩංගුවට පත්වන හෙයින් ද, සැබෑ කිරි ගොවීන් හඳුනාගෙන ඔවුන් සඳහා හැඳුනුම්පතක් නිකුත් කොට කිරි ගව පාලන කටයුතු වනෝද්‍යාන තුළ සිදු කිරීමට රජය විසින් සුදුසු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.39/2023

ගරු සමන්ප්‍රිය හේරත් මහතා,— මුරුංගා වගාව ව්‍යාප්ත කිරීම,— මුරුංගා හා මුරුංගා ආශ්‍රිත නිෂ්පාදනවලට ලෝකයේ විවිධ රටවලින් මෙන්ම දේශීය වෙළඳපොළ තුළ අධික ඉල්ලුමක් ඇති හෙයින් ද, ග්‍රාමීය ජනතාවගේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට මුරුංගා වගාව විශාල පිටුවහලක් වන හෙයින් ද, ශ්‍රී ලංකාවට එමඟින් විශාල විදේශ විනිමයක් උපයා ගැනීමට හැකියාවක් ඇති හෙයින් ද, මුරුංගා වගාව ව්‍යාප්ත කිරීම සඳහා වෙළඳපොළ හඳුන්වාදීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.40/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— විටමින් අවශ්‍යතාවය සම්පූර්ණ කරන පලතුරු දිවයින පුරා ප්‍රචලිත කිරීම,— ශ්‍රී ලංකාවට පලතුරු ආනයනය කිරීම සඳහා විශාල මුදලක් වැය වන හෙයින් ද, දිවයිනේ ඕනෑම ස්ථානයක වැවෙන පලතුරු ත්‍රිත්වයක් වන අන්නාසි, ගස්ලබු හා කෙසෙල් වර්තමානය වනවිට ආනයනය කරන හෙයින් ද, වැඩිහිටියන්ගේ හා ළමුන්ගේ විටමින් අවශ්‍යතාවය සම්පූර්ණ කරන මෙම පලතුරු වර්ග ත්‍රිත්වය දිවයින පුරා ප්‍රචලිත කිරීම හා ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.41/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— දේශීය කුරහන් නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම,— ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පරිභෝජනය කළ කුරහන්, විවිධ රෝගාබාධ නිවාරණය හා පාලනය කිරීමේ හැකියාවෙන් යුක්ත බව පෝෂණවේදීන් විසින් පෙන්වා දී ඇති හෙයින් ද, වර්තමානය වනවිට කුරහන් බහුල වශයෙන් මෙරටට ආනයනය කරන බැවින් ඒ සඳහා විශාල විදේශ විනිමය ප්‍රමාණයක් වැය වන හෙයින් ද, දේශීය කුරහන්වල නව ප්‍රභේද හඳුනාගෙන ඒවා ගොවීන් අතර ප්‍රචලිත කර දේශීය කුරහන් නිෂ්පාදනය ව්‍යාප්ත කිරීම සඳහා රජය විසින් යෝග්‍ය වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කරනු ලැබිය යුුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.42/2023

ගරු ඩී. වීරසිංහ මහතා,— විවිධ නිපුණතාවයන්ගෙන් පරිපූර්ණ ජ්‍යෙෂ්ඨ පුරවැසියන් ජාතික ආර්ථිකයට දායක කර ගැනීම,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන් අතරින් බහුතරයක් විවිධ වෘත්තීමය නිපුණතාවයන්ගෙන් යුක්ත වුවත් වන හෙයින් ද, පරිසර හිතකාමී නිෂ්පාදන කිරීමේ හැකියාවක් සහ දැනුමක් ඔවුන් සතු වුවත් ඒ සම්බන්ධ නිසි අධ්‍යයනයක් සිදු කර නොමැති හෙයින් ද, ජාතික ආර්ථිකයට ඔවුන්ගෙන් ලබා ගත හැකි දායකත්වය සක්‍රිය ලෙස ලබා ගැනීමේ ක්‍රමවේදයක් නොමැති හෙයින් ද, වැඩිහිටි නිවාසවල හෝ තමන්ගේ නිවෙස්වල හුදකලා දිවියක් ගතකරන මෙම ජ්‍යෙෂ්ඨ පුරවැසියන් තමන්ගේ වෘත්තීන්ට ඇති නිපුණත්වයත් අදාළ නිෂ්පාදන කිරීමට උනන්දු කර එම නිෂ්පාදන වෙළඳපොළට හඳුන්වා දීමෙන් ඔවුන්ට ආදායම් මාර්ගයක් ඇතිකිරීම හා මානසික ඒකාග්‍රතාවය පවත්වා ගැනීමට පිටුවහලක් වීම සඳහා සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.44/2023

ගරු වේලු කුමාර් මහතා,— වතුකර ප්‍රදේශවල ක්‍රීඩා ක්ෂේත්‍රය දියුණු කිරීම,— වතුකර ප්‍රදේශවල ජීවත්වන තරුණ තරුණියන් ක්‍රීඩා ක්ෂේත්‍රයේ ජාතික හා ජාත්‍යන්තර මට්ටමෙන් තමන්ගේ හැකියාවන් ප්‍රදර්ශනය කර ඇති හෙයින් ද, ඔවුන් අධ්‍යාපනය හදාරන වතු පාසල්වල මෙන්ම ජීවත්වන වතු ප්‍රදේශවල ද ක්‍රීඩා ක්ෂේත්‍රය සඳහා කිසිදු පහසුකමක් නොමැති හෙයින් ද, රටේ ක්‍රීඩා ක්ෂේත්‍රය සංවර්ධනය කිරීම පිණිස වතුකර ප්‍රදේශවල තරුණ තරුණියන්ගේ දායකත්වය ලබාගැනීම සඳහා ප්‍රදේශයට අදාළ ක්‍රීඩා සංවර්ධනය උදෙසා වැඩසටහනක් දියත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.45/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වතු ආශ්‍රිත ප්‍රදේශවල ක්‍රිකට් ක්‍රීඩාව දියුණු කිරීම,— ශ්‍රී ලංකාව ක්‍රිකට් ක්‍රීඩාවෙන් ජාත්‍යන්තර පිළිගැනීමට ලක්වූ රටක් වන හෙයින් ද, පසුගිය කාලය පුරාවටම ක්‍රිකට් කණ්ඩායමේ ක්‍රියාකාරකම් අස්ථාවර තත්ත්වයක පැවති හෙයින් ද, ඉතා දක්ෂ ක්‍රීඩකයන් බොහොමයක් සිටින වතු ප්‍රදේශවලට ද ක්‍රිකට් ක්‍රීඩාව පුහුණුවීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීමෙන් ඔවුන්ගේ දායකත්වය ද ශ්‍රී ලාංකික ක්‍රිකට් ක්‍රීඩාවේ දියුණුව උදෙසා ලබා ගැනීමට විශේෂ වැඩසටහනක් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.46/2023

ගරු වේලු කුමාර් මහතා,— වැවිලි තේ කර්මාන්ත ක්‍රමය වෙනුවට කුඩා තේ වතු ක්‍රමයක් ස්ථාපිත කිරීම,— ශ්‍රී ලංකාවේ තේ වගාව, වැවිලි ක්‍රමයට අයත් තේ වතු හා කුඩා තේ වතු ක්‍රමයට අයත් තේ වතු ලෙස දෙයාකාර වන හෙයින් ද, මින් වැවිලි ක්‍රමය මේ වන විටත් බිඳවැටෙමින් පවතින හෙයින් ද, වතු වැවිලි ක්‍රමය මඟින් සිදු කරන තේ වගාව, කුඩා තේ වතු ක්‍රමය දක්වා වෙනස් කොට එම වතුවල සේවය කරන කම්කරුවන්, කුඩා තේ වතුවල හිමිකරුවන් බවට පත් කොට ඒවා දියුණු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.47/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට ප්‍රජාවගේ පාරම්පරික කලා ශිල්ප වාණිජ කටයුත්තක් දක්වා වර්ධනය කිරීම,— වැවිලි ක්ෂේත්‍රය කේන්ද්‍ර කොටගත් ඉන්දියානු සම්භවයක් සහිත කඳුරට ප්‍රජාව ශ්‍රී ලංකාවේ සමස්ත ජන සමාජය නියෝජනය කරනු ලබන එක් ජන කොටසක් වන හෙයින් ද, නාඩගම්, කොහොඹකළේ නැටුම, කාවඩි නැටුම්, ලී කෙළි වැනි අංගයන්ගෙන් යුත් පාරම්පරික කලා ශිල්ප මෙම ජන සමාජය තුළ දක්නට ලැබෙන හෙයින් ද, එම කලා ශිල්ප ආරක්ෂා කොට වාණිජමය කටයුත්තක් දක්වා වර්ධනය කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් යෝග්‍ය මධ්‍යස්ථානයක් ස්ථාපිත කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.48/2023

ගරු වේලු කුමාර් මහතා,— ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන සඳහා ප්‍රමිතියක් හා නියාමනයක් ඇති කිරීම,— දිවයිනේ බොහෝ ප්‍රදේශවල පෞද්ගලික පාර්ශ්වයන් විසින් ළමා දිවා සුරැකුම් මධ්‍යස්ථාන පවත්වාගෙන යනු ලබන හෙයින් ද, වතු සමාගම් මඟින් පවත්වාගෙන යනු ලබන මෙවැනි මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක්, ක්‍රමවේදයක් හා නියාමනයක් සිදු නොවන හෙයින් ද, රටේ අනාගතය තීරණය කරන දරුවන්ගේ ආරක්ෂාව සහ සුබසාධනය උදෙසා එම මධ්‍යස්ථානවල නිසි ප්‍රමිතියක් සහ නියාමනයක් ඇති කිරීම සඳහා රජය විසින් සුදුසු පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.49/2023

ගරු වේලු කුමාර් මහතා,— මධ්‍යම පළාතේ වන වගා ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම,— ශ්‍රී ලංකාවේ බොහෝ ජල පෝෂිත ප්‍රදේශ මධ්‍යම කඳුකර කලාපවල විශේෂයෙන්ම මහනුවර සහ මාතලේ දිස්ත්‍රික්කවල පිහිටා ඇති හෙයින් ද, එම පෝෂිත ප්‍රදේශ පයිනස් වගාව හේතුවෙන් දැඩි බලපෑමකට ලක්වී තිබෙන හෙයින් ද, වන වගාවට පයිනස් ගස් සිටුවීම සම්පූර්ණයෙන් නතර කළ යුතු හෙයින් ද, ඒවා ගලවා ඉවත් කර මීට විකල්පයක් ලෙස ස්වභාවික වන වගා ක්‍රමය දියත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.50/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුකර වතු ජනතාවට පානීය ජල සැපයුම ලබාදීම,— කඳුකරයේ වතු ආශ්‍රිත ප්‍රදේශවල පානීය ජලය ලබාදීමේ සැලසුම් නිසි ආකාරයට ක්‍රියාත්මක නොවීම හේතුවෙන් එම ජනතාවගේ පානීය ජල අවශ්‍යතාවය ස්වභාවික ජල උල්පත්, ගංගා, ඇළ දොළ හා ළිං මඟින් සම්පූර්ණ කර ගන්නා හෙයින් ද, දැනට පවතින ජනගහනය ඉහළ යෑම හා කෘෂි රසායනික ද්‍රව්‍යවල අධික භාවිතය නිසා සිදුවී තිබෙන පරිසර දූෂණය හේතු කොටගෙන, භාවිතයට සුදුසු ජලය ලබාගත නොහැකි තත්ත්වයක් උද්ගතව තිබීමෙන් එම ජනතාවට නොයෙකුත් සෞඛ්‍ය ගැටලුවලට මුහුණ දීමට සිදු වී ඇති හෙයින් ද, වතු ප්‍රදේශවල තිබෙන ජලය පිට පළාත්වලට රැගෙන යෑම නිසා ජල හිඟයක් ඇති වී තිබෙන හෙයින් ද රටේ අනෙකුත් ප්‍රදේශවල ක්‍රියාත්මක වන පානීය ජල සැපයීමේ වැඩසටහන් මෙම ප්‍රදේශවල ද ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව අවධානය යොමු කරමින් රජයේ පානීය ජලය ලබා දීමේ වැඩපිළිවෙළට වතු ප්‍රදේශද ඇතුළත් කර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.51/2023

ගරු වේලු කුමාර් මහතා,— වතු ආශ්‍රිතව පවතින මාර්ග රජයට පවරා ගැනීම,— ශ්‍රී ලංකාව තුළ වැවිලි ක්ෂේත්‍රයට සුවිශේෂී ස්ථානයක් හිමි වී තිබෙන අතර වතුවල අයිතිය, කළමනාකරණය සහ පරිපාලනය විවිධ කාලයන්හිදී වෙනස්වීම්වලට ලක්වන හෙයින් ද, වතු කම්කරුවන්ගේ වාසස්ථාන ප්‍රධාන මාර්ගයේ සිට බොහෝ දුරස්ව වතු මධ්‍යයේ පිහිටා ඇති හෙයින් ද, මෙම ජනතාව භාවිතා කරන වතු මාර්ග සංවර්ධනය නොකර ඉතා අබලන් තත්ත්වයක පවතින හෙයින් ද, මෙකී මාර්ග පළාත් පාලන හා පළාත් සභා මාර්ග යටතට පැවරීමට රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.52/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— කාන්තා ගෘහමූලික පවුල් සවිබල ගැන්වීම,— ශ්‍රී ලංකාවේ පවුල් ඒකක අතරින් 25% ක් කාන්තා ගෘහමූලික පවුල් වන හෙයින් ද, ඉන් 50% ක් වැන්දඹුවන් වන හෙයින් ද, එම පවුල් මුහුණදෙන අභියෝග අතරින් ස්ත්‍රී- පුරුෂ සමාජභාවය හේතුවෙන් පැන නගින ගැටලු, ඉඩම් හිමිකම් ගැටලු, ජීවනෝපාය මාර්ග සීමාවීම හේතුවෙන් මුහුණ දෙන ගැටලු ප්‍රධාන තැනක් ගන්නා හෙයින් ද, දැනටමත් ජීවන වෘත්තියක යෙදී සිටින කාන්තාවන්ට ප්‍රමාණවත් පුහුණුව හා පහසුකම් නොමැතිවීම, අලෙවිකරණයේ පවතින ගැටලු, ඉඩම්වල පසු අයිතිය පැවරීමේ දී පිරිමි දරුවන්ට ප්‍රමුඛතාවය ලබාදීම හේතුවෙන් පැන නැගී ඇති ගැටලු ආදී ගැටලුකාරි තත්ත්වයන් රාශියකට මුහුණ දී ඇති හෙයින් ද, මෙම ගැටලුකාරි තත්ත්වයන්ට සාර්ථකව මුහුණදීම සඳහා තිරසර සැලැස්මක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.53/2023

ගරු වේලු කුමාර් මහතා,— කඳුරට වෘත්තීය සමිති විරු දිනය ප්‍රකාශයට පත්කිරීම,— කඳුරට වතුකර කම්කරුවන් ශ්‍රී ලාංකීය ඉතිහාසය තුළ එහි ආර්ථිකය වෙනුවෙන් සුවිශාල දායකත්වයක් ලබාදුන් ප්‍රජාවක් වන හෙයින් ද, ප්‍රජාතන්ත්‍රවාදී අරගල ඔස්සේ තම අයිතිවාසිකම් දිනා ගනිමින් එම අරගලයන් හි දී සිය ජීවිත පූජා කළ වෘත්තීය සමිති විරුවන් එක් පොදු දිනක දී සිහිපත් කිරීම මෙරට ජීවත්වන ඉන්දීය සම්භවයක් සහිත කඳුරට ජනතාවගේ දීර්ඝකාලීන ඉල්ලීමක් වන හෙයින් ද, 1939 දෙසැම්බර් සිට 1940 ජනවාරි දක්වා ශ්‍රී ලංකාවේ කඳුරට කම්කරු ප්‍රජාව විසින් වැටුප් වැඩි කරන මෙන් ඉල්ලා සිදු කරන ලද ප්‍රථම වෘත්තීය සමිති අරගලයේ දී සුදු ජාතිකයෙකු විසින් සිදුකරන ලද වෙඩි තැබීමකින් "මුල්ලෝයා ගෝවින්දන්" නමැති කම්කරුවා ජීවිතක්ෂයට පත් වූ හෙයින් ද, කඳුරට කම්කරු ප්‍රජාව විසින් සිදුකරන ලද අවිහිංසාවාදී අරගලයේ දී ජීවිතය පූජා කළ එම පළමු කම්කරුවා සහ ඉන් අනතුරුව කඳුරට කම්කරු ජනතා අයිතිවාසිකම් සහ සුභසාධනය සඳහා දියත් කෙරුණු බොහෝ වෘත්තීය සමිති අරගලයන් හි දී ජීවිත පූජා කළ අනෙකුත් විරුවන් සැමරීම සඳහා එම පළමු වෘත්තීය සමිති විරුවා මියගිය දිනය වන ජනවාරි 10 දින කඳුරට වෘත්තීය සමිති විරු දිනය ලෙස ප්‍රකාශයට පත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.54/2023

ගරු වේලු කුමාර් මහතා,— ශ්‍රී ලංකාවේ තැපැල් සේවය වැවිලි ක්ෂේත්‍රය තුළ විධිමත් කිරීම,— 1798 වර්ෂයේදී ආරම්භ කරන ලදුව 1882 වර්ෂයේදී ඉංග්‍රීසීන් විසින් විධිමත් කරන ලද වසර දෙසීයකට අධික ඉතිහාසයක් සහිත ශ්‍රී ලංකා තැපැල් සේවය අප රට තුළ නිදහසින් පසුව තැපැල් දෙපාර්තමේන්තුව මඟින් පවත්වාගෙන යන රජය විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවක් වන හෙයින් ද, කඳුරට වතුකර ජනතාව මෙරට පදිංචි වී වසර දෙසීයක පමණ කාලයක් ගත වී ඇතත් ඔවුන් පදිංචි නිවාස වෙත ඍජුව ලිපි රැගෙන ගොස් භාර දීමක් සිදු නොවන හෙයින් එම ජනතාව විවිධ අපහසුතාවන්ට පත් වී සිටින හෙයින් ද, අවුරුදු දෙසීයක කාලයක් වැවිලි ක්ෂේත්‍රයේ නියැලෙන මෙම ජනතාව වෙනුවෙන් තැපැල් සේවාව විධිමත් කිරීම සඳහා රජය විසින් අවශ්‍ය පියවර ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.58/2023

ගරු (මේජර්) සුදර්ශන දෙනිපිටිය මහතා,— කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් හට සහනදායී ක්‍රමයට ලබාදෙනු ලදුව, දැනට අත්හිටුවා ඇති වාර ප්‍රවේශ පත්‍ර නැවත ලබාදීම,— බොහෝ කාර්මික විද්‍යාලවල ඉගෙනුම ලබන සිසුන් බහුතරයක් අඩු ආදායම්ලාභී පවුල්වලට අයත් වන හෙයින් ද, දිනකට එක් ගමන් වාරයක් සඳහා සිසුවෙකුට විශාල මුදලක් වැය වන හෙයින් ද, සිසුන් පාඨමාලා හැදෑරීම සඳහා පැමිණෙන්නේ දැඩි ආර්ථික අපහසුතා මධ්‍යයේ වන හෙයින් ද, එම සිසුන් සඳහා 2022 අධ්‍යයන වර්ෂය අවසන් වන තෙක් සහනදායී ක්‍රමයට ලබාදුන් ශිෂ්‍ය වාර ප්‍රවේශ පත්‍ර 2023 අධ්‍යයන වර්ෂයේ සිට ලබාදීම අත්හිටුවා ඇති හෙයින් ද, එම අත්හිටුවීම අවලංගු කොට සහනදායි ක්‍රමයට ලබාදුන් ශිෂ්‍ය වාර ප්‍රවේශ පත්‍ර නැවත ලබා දීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.59/2023

ගරු සංජීව එදිරිමාන්න මහතා,— මිනිසාට ඉතාම හිතකර මී තෙල් නිෂ්පාදනය කිරීම,— කෘෂි කර්මාන්තයට මෙන්ම මිනිසාට ද ඉතාම හිතකර මී තෙල් නිෂ්පාදනය කිරීමට අවශ්‍ය මී වෘක්ෂ ව්‍යාප්ත කිරීම සඳහා වෙල් ආශ්‍රිතව මී වෘක්ෂ රෝපණය කිරීමටත්, දේශීය වශයෙන් නිෂ්පාදනය කළ හැකි මී තෙල් පරිභෝජනය සම්බන්ධයෙන් ජනතාව දැනුම්වත් කිරීමටත්, මී තෙල්වල ගුණාත්මකභාවය පිළිබඳව අන්තර්ජාතික වශයෙන් දැනුම්වත් කිරීමටත්, මී තෙල් අපනයනය කිරීමටත් කඩිනම් වැඩපිළිවෙළක් රජය විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.60/2023

ගරු ලලිත් වර්ණ කුමාර මහතා,— ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා ජීව විද්‍යාත්මක වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීම,— ශ්‍රී ලංකාවේ ඩෙංගු රෝගය මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග එතරම් ප්‍රගතියක් නොපෙන්වන හෙයින් ද, වාර්ෂිකව ඩෙංගු රෝගීන්ගේ වර්ධනයක් පෙන්වන හෙයින් ද, මදුරුවන් බෝවීම වැළැක්වීම සඳහා නිසි විද්‍යාත්මක ක්‍රම අනුගමනය නොකළහොත් මදුරු දඟර නිෂ්පාදන සමාගම් බහුලව අවශ්‍ය වීම සහ මදුරු දඟර අලෙවි කිරීම සඳහා භාවිත කරන ආකර්ශණීය වෙළඳ දැන්වීම් හේතුවෙන් ජනතාව නොමඟ යෑම ද වැළැක්විය නොහැකි හෙයින්, ඩෙංගු මදුරුවන් මර්දනය කිරීම සඳහා අදාළ අංශ ද සහභාගි කර ගනිමින් ජීව විද්‍යාත්මක වැඩපිළිවෙළක් රජය විසින් කඩිනමින් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.61/2023

ගරු කුමාරසිරි රත්නායක මහතා,— මරගල පරිසර පද්ධතිය ආරක්ෂා කර ගැනීම,— මොනරාගල නගරයේ හා තදාසන්නව පදිංචි පවුල් 4000කට වැඩි සංඛ්‍යාවකට පානීය ජලය සැපයීම මරගල කඳුවැටියේ පිහිටි ජල මූලාශ්‍රවලින් සිදු වන හෙයින් ද, ඉංග්‍රීසි පාලන සමයේ තේ හා කෝපි වගා කර තිබූ මෙම කඳු පන්තියේ වර්තමානය වනවිට ජනතා වතු සංවර්ධන මණ්ඩලය යටතේ රබර් වගා කර ඇති හෙයින් ද, මෙහි පේළි නිවාසවල විශාල පිරිසක් ජීවත්වන හෙයින් ද, මෙහි නව නිවාස ඉදිකිරීම සඳහාත්, වගා කටයුතු සඳහාත් කැලෑ එළි කිරීම හා කැලෑ ගිනි තැබීම විශාල පාරිසරික ගැටලුවක් බවට පත් වී ඇති හෙයින් ද, මෙසේ විනාශ වෙමින් පවතින පරිසර පද්ධතිය හා ජල මූලාශ්‍ර ආරක්ෂා කර ගැනීම සඳහා ගැසට් නිවේදනයක් මඟින් මෙම ප්‍රදේශය පාරිසරික ආරක්ෂක ප්‍රදේශයක් ලෙස නම් කර ඇති හෙයින් ද, මෙම ප්‍රදේශය එළි පෙහෙළි කිරීම හා නිවාස ඉදිකිරීම නවතා දැමීමටත් දෙවැනි හා තෙවැනි පරම්පරා සඳහා වෙනත් සුදුසු ප්‍රදේශවලින් විකල්ප ඉඩම් ලබාදීමටත් අවශ්‍ය කටයුතු රජය විසින් කඩිනමින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.62/2023

ගරු දයාසිරි ජයසේකර මහතා,— දේශීය වෛද්‍ය කටයුතු වෙනුවෙන් වෛද්‍ය සභාවක් ස්ථාපිත කිරීම,— ලෝකයේ විශිෂ්ට සංස්කෘතියක් සහිත ශ්‍රී ලංකාවේ අවුරුදු දෙදහස් පන්සියයක ඉපැරණි ඉතිහාසයක් පුරා ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් සුවපත් කරන ලද දේශීය පාරම්පරික වෛද්‍යවරුන් හා හෙළ වෙදකමේ අනාගතය රටේ අනාගත පරපුර සඳහා සුරක්ෂිත කිරීම අවශ්‍ය වන හෙයින්, දේශීය හෙළ වෙදකම ආරක්ෂා කර ගැනීමේ අරමුණින් මෙම වෛද්‍ය ක්‍රමය හා වෛද්‍යවරුන් ආරක්ෂා කොට සුරක්ෂිත කර පෝෂණය කිරීම සඳහා දේශීය වෛද්‍යවරුන් අතරින් දේශීය වෛද්‍ය සභාවක් ස්ථාපිත කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.63/2023

ගරු මයන්ත දිසානායක මහතා,— දුෂ්කර හා අඩු පහසුකම් සහිත ප්‍රදේශවල පිහිටි විනාශයට පත්ව ඇති බෞද්ධ සිද්ධස්ථාන රැක ගැනීම,— උතුරු හා වන්නි ප්‍රදේශවල සහ දුෂ්කර ප්‍රදේශවල විනාශයට පත්ව ඇති පන්සල් සහ ඓතිහාසික බෞද්ධ සිද්ධස්ථාන ආරක්ෂා කිරීමට හා එම ස්ථාන සඳහා රාජ්‍ය අරමුදලක් යොදවා සංවර්ධන කටයුතු කිරීමට සුදුසු වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.64/2023

ගරු මයන්ත දිසානායක මහතා,— අතරමං වූ විදේශගත ශ්‍රමිකයන් සුරක්ෂිතව මෙරටට ගෙන්වා ගැනීම,— ශ්‍රී ලංකාවට වැඩිම විදේශ විනිමය උපයා දෙනු ලබන්නේ විදේශ ශ්‍රමිකයන් වන හෙයින් ද, ව්‍යාජ ලෙස ශ්‍රමිකයන් විදේශගත කරවීමේ නිරතවන ජාවාරම්කරුවන් හේතුවෙන් ශ්‍රමිකයන් මැදපෙරදිග බොහෝ රටවල අසරණ තත්ත්වයට පත්ව ඇති හෙයින් ද, ඔවුන් සුරක්ෂිතව මෙරටට ගෙන්වා ගැනීමට කඩිනම් වැඩසටහනක් දියත් කිරීමට අවශ්‍ය පියවර රජය විසින් ගනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.65/2023

ගරු මයන්ත දිසානායක මහතා,— ආක්‍රමණික වල්පැළෑටි හේතුවෙන් වික්ටෝරියා ජලාශයට සිදුවන හානිය අවම කිරීම,— ශ්‍රී ලංකාවේ ජෛව විවිධත්වයට හා වික්ටෝරියා ඇතුළු ජලාශවලට ආක්‍රමණික වල්පැළෑටිවලින් අධික හානියක් සිදුවන හෙයින් ද, දැනටමත් වික්ටෝරියා ජලාශයේ ඇතැම් කලාපවලට ඉන් බලපෑම් සිදු වී ඇති හෙයින් ද, මෙම ආක්‍රමණික වල්පැළෑටි ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.66/2023

ගරු මයන්ත දිසානායක මහතා,— දේශීය වී වර්ග වගා කිරීම ප්‍රවර්ධනය කිරීම හා නව වී ප්‍රභේදයන් හඳුන්වාදීම,— දේශීය වී වර්ග පිළිබඳ ගොවි මහතුන් දැනුම්වත් කර එම වී වගා කිරීමට අවශ්‍ය සියලුම පහසුකම් සපයා දීම සහ ලෝකයේ අලුතෙන් බිහිකරන වැඩි අස්වැන්නක් ලබා දෙන වී ප්‍රභේද මෙරටට ගෙන්වා පර්යේෂණ සිදුකර දේශීය ගොවීන්ට ඒවා ලබා දී වගා කටයුතු කිරීමට අවශ්‍ය පහසුකම් සලසා දීමට රජය විසින් වැඩසටහනක් සැලසුම් කර ක්‍රියාත්මක කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.67/2023

ගරු මයන්ත දිසානායක මහතා,— තරුණ ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රමයක් ඇති කිරීම,— විරැකියාවෙන් පෙළෙන තරුණ තරුණියන් අතරින් ව්‍යවසායකයන් බිහි කිරීම සඳහා බැංකු පද්ධතිය හරහා සහනදායී පොළී අනුපාතයක් යටතේ ඔවුන්ට ණය පහසුකම් සැපයීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය වැඩපිළිවෙළක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.68/2023

ගරු හේෂා විතානගේ මහතා,— ආගමික අන්තවාදය වැළැක්වීමේ අවශ්‍යතාවය,— කවර රටක කවර ක්ෂේත්‍රයක වුව ද අන්තවාදී අදහස් තිබීම ඉතා හානිකර වන හෙයින් ද, ආගමික අන්තවාදය පිළිබඳව පසුගිය පාස්කු ප්‍රහාරයෙන් පසුව සමාජයේ විශාල කථිකාවතක් ඇති වී තිබෙන හෙයින් ද, ආගමික අන්තවාදය මතුවීම හා ප්‍රවර්ධනය කිරීම වැළැක්වීම සහ එයට දැනටමත් ගොදුරු වී සිටින පුද්ගලයන් පුනරුත්ථාපනය කිරීම සඳහා කඩිනම් වැඩසටහනක් රජය විසින් සකස් කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.69/2023

ගරු හේෂා විතානගේ මහතා,— රුවන්පුර අධිවේගී මාර්ගයේ ඉදිකිරීම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම,— රුවන්පුර අධිවේගී මාර්ගය ඉදිකිරීමේ ප්‍රතිලාභ රත්නපුර දිස්ත්‍රික්කයට පමණක් නොව බදුල්ල සහ හම්බන්තොට දිස්ත්‍රික්කවල ජනතාවට ද ලැබෙන හෙයින් රටේ පවතින ආර්ථික දුෂ්කරතා හමුවේ වුව ද විශාල ප්‍රතිලාභ රැසක් ලබා ගැනීමට හැකියාව ඇති මෙම ව්‍යාපෘති අඛණ්ඩව කොටස් වශයෙන් හෝ ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා.70/2023

ගරු හේෂා විතානගේ මහතා,— කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම,— ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවට වැඩිම ආදායමක් ලබා දෙන දුම්රිය මාර්ගයක් ලෙස කැලණිවැලි දුම්රිය මාර්ගය සළකනු ලබන හෙයින් ද, මෙම දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීම තුළින් එහි ප්‍රතිලාභ රත්නපුර, හම්බනේතාට සහ බදුල්ල ඇතුළු දිස්ත්‍රික්ක රැසක ජනතාවට භුක්ති විඳිය හැකි වන හෙයින් ද, කැලණිවැලි දුම්රිය මාර්ගය රත්නපුර දක්වා දීර්ඝ කිරීමට අවශ්‍ය කටයුතු රජය විසින් සිදු කරනු ලැබිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.